**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

**"Making of Indian Constitution"ඡායාරූප ප්‍රදර්ශනය ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේදී**

"Making of Indian Constitution" (ඉන්දියානු ව්‍යවස්ථාවේ ගමන් මඟ) ඡායාරූප ප්‍රදර්ශනය ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා අතින් 2019 නොවැම්බර් මස 26 වන දින විවෘත කෙරිණ.

ඉන්දීය ව්‍යවස්ථාවේ 70 වන සංවත්සරය සනිටුහන් කෙරෙමින් වසර මුළුල්ලේ පැවැත්වෙන සැමරුම් මාලාවේ සමාරම්භය වූ මෙම අවස්ථාවේදී නියෝජ්‍ය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා ව්‍යවස්ථා දිනයෙහි (නොවැම්බර් 26) වැදගත්කම පිළිබඳව අදහස් දැක්වූ අතර අද වන විට ඉන්දීය ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම සකස් කරනු ලබන ඉන්දියානු ව්‍යවස්ථාවේ ගමන් මඟ පිළිබඳවද පැහැදිලි කළේය. එසේම නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා ඉන්දියාවේ ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායන් පිළිබඳවද ශක්තිමත්, ප්‍රජාතාන්ත්‍රික සහ නිරාගමික ඉන්දියාවක් සඳහා පදනම සකස් කිරීමෙහි ලා ඉන්දියානු ව්‍යවස්ථාව විසින් ඉටු කරන ලද මෙහෙයද අවධාරණය කළේය.

ඉන්දියානු ව්‍යවස්ථාව සකස් කිරීමේ ක්‍රියාවලිය සහ නිදහස් ඉන්දියාවේ ප්‍රථම අධිකරණ අමාත්‍ය සහ ඉන්දියානු ව්‍යවස්ථාවේ ප්‍රධානතම නිර්මාතෘවරයා ලෙස සැලකෙන ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර් ඇතුළු පළමු ව්‍යවස්ථාදායක සභාව රැස්වීම ආදී දුර්ලභ ඡායාරූප මෙම ප්‍රදර්ශනයට ඇතුළත් වේ.

ජාත්‍යන්තර අධ්‍යයන සඳහා බණ්ඩාරනායක මධ්‍යස්ථානයේ ගුරුවරුන් සහ සිසු සිසුවියන් සමාරම්භක අවස්ථාවට සහභාගී විය.

16/2, ආර්. ජී. සේනානායක මාවත, කොළඹ 07 හි පිහිටි ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානයේ පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය නොවැම්බර් 26 වන දින සිට 28 වන දින දක්වා මහජනතාවට විවෘතව පවතී.

*****

කොළඹ

2019 නොවැම්බර් 26